**මාධ්‍ය නිවේදනය**

**1 ඔක්තෝම්බර් 2019 කොළඹදී...**

Good Food, Good Life

# නෙස්ලේ සමාගම, 2018/2019 වර්ෂයේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අංශයේ 'හොඳම අපනයනකරු' සම්මානය දිනාගනී

පසුගියදා පැවැති ජනාධිපති අපනයන සම්මාන උළෙලේදී 2018/2019 වර්ෂයේ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අංශයේ 'හොඳම අපනයනකරු' සම්මානය දිනාගැනීමට නෙස්ලේ සමාගම සමත්විය. මෙරට අපනයන සඳහා දැක්වූ ශක්තිමත් දායකත්වයත්, දේශීය පොල් වගාකරුවන්ට හා ගොවිපොළ සේවකයන්ට තිරසාර ජීවිකාවක් උදාකරලීමට ගත් ප්‍රයත්නයත් විශේෂ පිළිගැනීමට ලක්කරමින්, නෙස්ලේ සමාගම මෙසේ ජනාධිපති අපනයන සම්මානයට පාත්‍ර වූ අටවැනි අවස්ථාව මෙය විය.

මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ කළමනාකාර අධ්‍යක්ෂක, ෆැබ්‍රිස් කැවලින් මහතා මෙසේ පැවසීය. "මේ සම්මානය හිමිවීම අපට නිහතමානී සතුටක් වගේම ගෞරවයක්. එය අපගේ පිටිකළ පොල් කිරි අපනයන මෙහෙයුමේ සාර්ථකත්වයට කදිම සහතිකයක් වගේම, ලොව පුරා ජනතාව අපේ නිෂ්පාදන සන්නාමය කෙරෙහි තැබූ විශ්වාසය පිළිබඳ සහතිකයක්. ඒ වගේම ශක්තිමත් ප්‍රජාවක් ගොඩනැගීම, ගොවි පවුල් සවිබලගැන්වීම සහ දේශීය පොල් කර්මාන්තයේ දීර්ඝ කාලීන සාර්ථකත්වය වෙනුවෙන් පොල් සැපයුම සුරක්ෂිත කිරීම වෙනුවෙන් ලැබුම පිළිගැනීමක් ලෙසත් මේ සම්මානය හැඳින්විය හැකියි. එසේ අපගේ කාර්යයන් ඇගැයීමට ලක්කිරීම විශාල ප්‍රීතියක් වගේම, අපි එදිනෙදා සිදුකරන කටයුතු පිළිබඳ ආඩම්බරයක් අපට හිමිකරදෙනවා".

නෙස්ලේ ලංකා සමාගම, ලොව විශාලතම පිටිකළ පොල් කිරි අපනයනකරුවන් අතරින් එකකි. එමගින් දේශීය පොල් වගාකරුවන්ට ද විශාල ධනාත්මක බලපෑමක් සිදුව තිබේ. ශ්‍රී ලාංකික පොල් ගොවි පවුල්වලට තිරසාර ආදායම් මාර්ගයක් හිමිකරදෙමින්, වසරකදී එවැනි පවුල් 6,600කින් පමණ පොල් ගෙඩි මිලියන 90ක් පමණ නෙස්ලේ සමාගම මිලදී ගනී. එසේ පොල් මිලදීගැනීම වෙනුවෙන් 2018 වසර තුළ පමණක් සමාගම, දේශීය ගොවීන් අතරේ බෙදාදුන් මුදල රුපියල් බිලියන 4.6කි. ඊට අමතරව තවත් පොල් ගොවීන් හා පොල් වගාකරුවන් 3,000කට පමණ 'Nestlé Coconut Plan' හරහා ද සෙත සැලසේ.

මෙරට පොල් වගා කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් 2016 වසරේදී පොල් වගා මණ්ඩලය හා එක්ව 'නෙස්ලේ පොල් වගා සැලසුම' නම් වැඩසටහනක් ද හඳුන්වාදෙන ලදී. මේ හරහා පොල් ගොවීන්ට හා වගාකරුවන්ට, පොල් වගාකිරීමේදී අවශ්‍ය තාක්ෂණික සහාය, පොහොර වැනි පහසුකම් ද පුහුණු හා සංවර්ධන වැඩසටහන් ද පිරිනැමේ. තව ද ඒ හරහා රෝග ආසාදනවලට ප්‍රතිරෝධතා සහිත, හා වසර 4-5ක් අතරතුර ඉක්මණින් පරිණතභාවයට පත්වන දෙමුහුන් පොල් පැළ 19,000ක් පමණ ප්‍රදානය කර ඇත. එමෙන්ම පොල් ගොවීන්ට හා වගාකරුවන්ට පොල් සැපයුම හා ගුණාත්මකභාවය පවත්වාගැනීමට සහාය වීම සඳහා ආදර්ශ ගොවිපොළ ද ඉදිකිරීමට මෙම පොල් වගා සැලසුම හරහා පියවර ගෙන තිබේ.

"වසරක් පාසා දේශීය අපනයන වෙනුවෙන් අපේ අඛණ්ඩ කාර්යභාරය හා දායකත්වය වෙනුවෙන් ලැබෙන මේ පිළිගැනීම සම්බන්ධයෙන් අපි ගොඩක් ආඩම්බරයට පත්වෙනවා. මීට වසර 30කටත් පෙරාතුව, අපගේ මැගී පිටිකළ පොල් කිරි නිෂ්පාදනය එළිදැක්වුණේ පරිවර්තනීය වෙනසක් සමගයි. අපගේ පරිශ්‍රමයන් තුළින් හොඳම රසයෙන් හා අඛණ්ඩ ගුණාත්මක බවින් යුතු නිෂ්පාදනයක් අද දවසේ බිහිකරන්න හැකිවෙලා තියෙනවා" යැයි නෙස්ලේ උප සභාපති (සැපයුම් දාම), පන්වද්වරම් සතියේන්ද්‍ර මහතා පැවසීය.

ජනාධිපති අපනයන සම්මාන උළෙල යනු මෙරට අපනයන ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් දැක්වූ සමාගම් අගය කිරීමටත්, සම්මාන පිරිනැමීමටත් වෙන්වූ වාර්ෂික උත්සවයකි. එය සංවිධානය කරනු ලබන්නේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසිනි. මීට පෙර 2018 වර්ෂයේදී ද පොල් මදය ආශ්‍රිත නිෂ්පාදන අංශය වෙනුවෙන් 'වැඩිම විදේශ විනිමය ඉපැයුමක් සිදුකළ අපනයනකරු' සම්මානය, 2017දී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන කාණ්ඩයේ වැඩිම අගය එකතුකළ අපනයනකරු සම්මානය, පෙර 2014 හා 2015 වර්ෂවලදී අපනයන සඳහා දායකත්වය දුන් හොඳම බහුජාතික සමාගම යන සම්මාන, 2013 හා 2010 වසරවලදී පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු සම්මාන, 2011 දී ආහාර සහ වෙනත් පාන වර්ග නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු සම්මානය ඇතුළු සම්මාන රැසක් එහිදී දිනාගැනීමට නෙස්ලේ සමාගම සමත්ව තිබේ.